**ඇබෑර්තු**

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය,**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) තනතුර - (තනතුරු 01)**

1. **වැටුප් පරිමාණය:** : රු.22,440/- 4 x 325- 18 x 475 - 32,290 (මාසික) (මීට අමතරව මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.) තෝරාගත් අයදුම්කරුවන් පළපුරුද්ද හා සුදුසුකම් මත සුදුසු වැටුප් තලයක පිහිටුවනු ලැබේ.

2. **වයස් සීමාව** : අවු : 35-45 (දැනටමත් රාජ්‍ය අංශයේ, සංස්ථා,මණ්ඩල සේවයේ නියුතුවුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :

i. කළමනාකරණය, අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියක් සමඟ රාජ්‍ය හෝ පිළිගත් ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 6 ක පළපුරුද්ද.(අවම වශයෙන් මින් වසර 03 ක් විධායක මට්ටමේ පළපුරුද්ද විය යුතුය.)

**හෝ**

ii. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ හෝ මහා බ්‍රිතාන්‍යයේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය සමග, රාජ්‍ය හෝ පිළිගත් ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්ද. (අවම වශයෙන් මින් වසර 03 ක් විධායක මට්ටමේ පළපුරුද්ද විය යුතුය)

**හෝ**

iii. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව රාජ්‍ය හෝ පිළිගත් වාණිජ ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර 8 ක අලෙවිකරණ පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් විධායක මට්ටමේ විය යුතුය.)

රක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**2.** <u>නියෝජ්‍ය අධ්‍යක්ෂ (රක්ෂණ) තනතුර - (තනතුරු **01**)</u>

1. **වැටුප් පරිමාණය** : රු.22,440/- 4 x 325- 18 x 475 - 32,290 (මාසික) (මීට අමතරව මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.) තෝරාගත් අයදුම්කරුවන් පළපුරුද්ද හා සුදුසුකම් මත සුදුසු වැටුප් තලයක පිහිටුවනු ලැබේ.

2. **වයස් සීමාව** : අවු : 35-45 (දැනටමත් රාජ්‍ය අංශයේ, සංස්ථා මණ්ඩල සේවයේ නියුතුවූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :

**i.** කළමනාකරණය, රක්ෂණය, ව්‍යාපාර පරිපාලනය හෝ සමාන ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් සමග රාජ්‍ය හෝ පිළිගත් රක්ෂණ ආයතනයක රක්ෂණ විෂය ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්ද. (අවම වශයෙන් මින් වසර 03 ක් විධායක මට්ටමේ පළපුරුද්ද විය යුතුය.)

**හෝ**

ii ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ හෝ මහා බ්‍රිතාන්‍යයේ වරලත් රක්ෂණ ආයතනයේ සාමාජිකත්වය සමග, රාජ්‍ය හෝ පිළිගත් රක්ෂණ ආයතනයක රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්ද. (අවම වශයෙන් මින් වසර 03 ක් විධායක මට්ටමේ පළපුරුද්ද විය යුතුය.)

**හෝ**

iii පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව රාජ්‍ය හෝ පිළිගත් රක්ෂණ ආයතනයක රක්ෂණ විෂය ක්ෂේත්‍රයේ වසර 08 ක විධායක මට්ටමේ පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 05 ක් විධායක මට්ටමේ පළපුරුද්ද විය යුතුය.)

ජීවගණක/පුනර් රක්ෂණ දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.

## 3. සහකාර අධ්‍යක්ෂ තනතුර - (තනතුරු 01)

1. **වැටුප් පරිමාණය:** : රු.20,490/- 10 x 325- 18 x 475 - 32,290 (මාසික)
(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

2. **වයස් සීමාව** :- අවු : 25 - 45 අතර
(දැනටමත් රාජ්‍ය අංශයේ, සංස්ථා හා මණ්ඩල සේවයේ නියුක්ත අයවලුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද**:-

i. පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු වන හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිත උපාධියක් හෝ ප්‍රථම උපාධිය සමග පශ්චාත් උපාධියක් සහිතව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/මණ්ඩලයක, වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද.

**හෝ**

ii පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක වසර 05 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද.

4. **අතිරේක සුදුසුකම්** :-

i. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා/සහතික පත්‍ර ලාභියෙකු වීම

ii. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රයයෙන් වැඩ කිරීමේ හැකියාව

iii. කෘෂිකර්මය/කළමනාකරණය/අලෙවිකරණය/රක්ෂණය පිළිබඳ උපාධිධාරියෙකු වීම අතිරේක සුදුසුකම් වේ

## 4. සංවර්ධන නිලධාරී තනතුර - (තනතුරු 03)

1. **වැටුප් පරිමාණය** : රු.15,240/- 10x185-4x210 - 15x290 -7x320 -24,520/- (මාසික) (මීට අමතරව මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

2. **වයස් සීමාව** : අවු : 25 - 45 අතර
දැනටමත් රාජ්‍ය අංශයේ. සංස්ථා හා මණ්ඩල සේවයේ නියුක්ත අයවලුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **අධ්‍යාපන සුදුසුකම්** :

i. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකුවීම. (කෘෂිකර්මය, කළමණාකරනය, අලෙවිකරණය, රක්‍ෂණය පිළිබද උපාධිධාරියෙකු වීම සහ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ත්‍රයි භාෂා මාධ්‍යයන්ගෙන් වැඩකිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක්වේ.)

## 5. බඳවා ගන්නා ආකාරය : විධිමත් සම්මුඛ පරීක්ෂණයකින්

## 6. සේවා කොන්දේසි

මෙම තනතුර ස්ථිරය. සේවා දායකයා විසින් 10% ක් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් 12% යන පදනම යටතේ සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතුයි. මණ්ඩලය මගින් 3% ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද දායකත්වය සළසනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, අපේක්ෂකයා තෝරාගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුලත ඔහු සේවයෙන් මුදාහැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

**7. <u>අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය</u> :**

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුලත් අයදුම්පත, සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ ඥාතීන් නොවන තොරතුරු දැනගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද සහිතව 2009.06.05 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතික වල පිටපත් අමුණා නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය. බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

සභාපති<br>
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය<br>
27, වොක්ෂෝල් වීදිය<br>
කොළඹ 02.<br>
2009 මැයි 21 දින